# සිනමාවෙන් ප්‍රකාශිත අනුරාධපුර හා නූතන යුගවල මානව අරමුණු පිළිබඳ ආනුභවික අධ්‍යයනයක්

ජී. ඒ. එච්. විරංග[1], කේ. ලංකාමුල්ල[2], ජී. ඒ. එස්. චතුරංග[3]

## හැඳින්වීම

සිනමාව දෘශ්‍යාත්මක මානව විද්‍යා විෂය පථයේ අධ්‍යයනයනට යොදාගන්නා ප්‍රමුඛ වූ විෂය පථයකි (මැක්ඩොගල්, 1998). මෙම පර්යේෂණය දෘශ්‍යාත්මක මානව විද්‍යාව හා විචාරාත්මක අධ්‍යයනය මූලික කරගත්තකි. ලාංකේය සිනමා කෘති දෙකකින් මෙරට ඉතිහාසයේ ප්‍රධාන යුග දෙකක සමාජවල මානව අරමුණු තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එසේ ම මෙහි දී ප්‍රබන්ධ මත පදනම් ව අධ්‍යයනය සිදු කිරීම හේතුවෙන් තත්‍ය සමාජයේ ස්වරූපය අධ්‍යයනයකට වඩා අරමුණු කරනුයේ එම සමාජ පිළිබඳ නූතන නිර්මාණකරුවන්ගේ පරිකල්පන දෘෂ්ටීන් පිළිබඳ ව ද අධ්‍යයනය කිරීම ය. ඉතිහාසය වැනි නිර්මාණාත්මක නොවූ විෂයයක් පවා සැබෑවට සිදු වූයේ කුමක් ද යන්නට ද වඩා, සිදුවීම් පුද්ගලයනට අවශ්‍ය පරිදි කියවා ගැනීමට භාවිත කෙරෙයි (බයිලින්, 1982). එසේ ම මෙම චිත්‍රපටයේ දී පැහැදිලි ව ප්‍රබන්ධ මත පර්යේෂණ නිගමන ගොඩනගයි. ලාංකේය සමාජයේ විවිධ යුග අතර අනුරාධපුර යුගය සංස්කෘතික ව උසස් යුගයක් වශයෙන් හඳුන්වන අතර නූතන යුගය සමස්තයක් වශයෙන් තාක්ෂණික ව දියුණු යුගයකි. මහරජ ගැමුණු චිත්‍රපටය නිර්මාණය වනුයේ එනමින් ම වන ජයන්ත චන්ද්‍රසිරිගේ ම නවකතාව පාදක කරගෙන වන අතර ගම්පෙරළිය චිත්‍රපටය නිර්මාණය වනුයේ මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරළිය නවකතාව පාදක කරගෙන ය. පර්යේෂණ ගැටලුව වශයෙන් අනුරාධපුර හා නූතන යුගයේ මානව අරමුණුවල වෙනස කුමක් ද යන්න ය. පර්යේෂණයේ වැදගත්කම වන්නේ අනුරාධපුර යුගයේ ජීවත් වූ මානවයාගේ අරමුණු ප්‍රබන්ධ පාදක කරගෙන විමර්ශනය කිරීමෙන් අද්‍යතන මිනිසාගේ අරමුණුවල ස්වරූපය අවබෝධ කර ගැනීමෙහි ලා හැකියාව ලැබීමයි. අප ගෙවමින් සිටින තත් සමාජය සැබෑ වශයෙන් අවබෝධ කරගැනීමට මිනුමක් මෙමගින් ගොඩනගා ගත හැකි වෙයි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ පර්යේෂණ සැලසුම වන්නේ තත් චිත්‍රපට ද්විත්වය නිරීක්ෂණයෙන් තෝරාගත් සිදුවීම් හා ආබද්ධ සමාන අසමානතා ආශ්‍රය කර ගනිමින් ලාංකේය සමාජයේ යුග දෙකක පවත්නා වූ පුද්ගල අරමුණු අධ්‍යයනය කිරීම ය.

1. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව. hashanviranga24@email.com

2. සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව

3. ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ, 10250, ශ්‍රී ලංකාව

පර්යේෂණයේ නියැදිය වන්නේ ජයන්ත චන්ද්‍රසිරිගේ මහරජ ගැමුණු චිත්‍රපටයත් හා ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ ගම්පෙරළිය යන චිත්‍රපටයත් ය. පර්යේෂණයේ දී දෘශ්‍යාත්මක මානව විද්‍යාව න්‍යායාත්මක ප්‍රවේශ වශයෙන් අවශ්‍ය පරිදි භාවිත කෙරෙයි. දත්ත රැස්කිරීමේ ක්‍රමය වන්නේ ගම්පෙරළිය හා මහරජ ගැමුණු චිත්‍රපටවල රූපරාමු හා දෙබස් ය. දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය වන්නේ අන්තර් පාඨන විශ්ලේෂණය හා තුලනාත්මක අධ්‍යයන ක්‍රමය යි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

මෙම නිර්මාණකරුවන් දෙදෙනා ම එකී සමාජ සන්දර්භය පිළිබඳ තත්ත්වාවබෝධය ඇතුව හා එම සමාජයන්ගේ සංස්කෘතික ශක්තිය දැන හැඳින ගත් නිර්මාණකරුවන් වේ. ජයන්ත චන්ද්‍රසිරිගේ මහරජ ගැමුණු චිත්‍රපටය ද අධ්‍යයනයකින් පසුව ලියන ලද නවකතාවක් පාදක කරගෙන නිර්මාණය කෙරුණකි. එසේ ම මාර්ටින් වික්‍රමසිංහගේ ගම්පෙරළිය නවකතාව නූතන ලාංකේය සමාජයේ ස්වරූපය සමීප නිරීක්ෂණයෙන් අවබෝධ කරගත් නිර්මාණ වේ. මෙම පර්යේෂණය සඳහා මෙම චිත්‍රපට ද්විත්වයෙහි ප්‍රධාන චරිත දෙක වන ගම්පෙරළියෙහි පියල්ගේ චරිතයත් මහරජ ගැමුණු චිත්‍රපටයෙහි ගැමුණු චරිතයත් මුඛ්‍ය වශයෙන් භාවිත කෙරුණ ද අප්‍රධාන චරිත ද අධ්‍යයනය ද කෙරෙයි.

ගම්පෙරළිය චිත්‍රපටය නූතන සමාජයේ ආරම්භක ලාංකේය ස්වරූපය දෘශ්‍යාත්මක සංරචකවලින් ප්‍රතීයමාන කරයි. නූතන සමාජයේ පුද්ගලයන් ජීවත්වීම උදෙසා අරගලයක නිරත වීම ප්‍රධාන ලක්ෂණයකි. සමාජයේ එක් පුද්ගල කොටසක් ආර්ථික වශයෙන් දුර්වල වන විට තවත් කොටසක් පොහොසත් වේ. මෙනිසා නූතන යුගයේ පන්ති සමාජය පැහැදිලි ව නිරීක්ෂණය වේ. ආර්ථික භෝග හා දේපළ මත මිනිස් ජීවිතවල අනාගතය තීරණය වීම සිදු වේ. ආදරය ප්‍රේමය වැනි අතිශය වැදගත් කාරණා විෂයයෙහි මිනිසාට සිය ඓන්ද්‍රීය සිතුවිලි මත පිහිටා කටයුතු කිරීමට අයිතිය හා ඉඩ ප්‍රස්තා තිබිය යුතු ය (බදියු, 2012). එහෙත් නූතන යුගයේ පියල්, නන්දා, ජිනදාස යන තිදෙනාගේ ම විවාහ තීරණය වනුයේ ප්‍රේමය මත පදනම් වෙමින් නොවේ. ඇලේන් බදියුගේ ප්‍රේමය පසසනු වස් කෘතියේ දී මෙම යෝජිත විවාහයේ පවත්නා වූ ගැටලුව සාකච්ඡා කරයි. එනමුත් අනුරාධපුර සමාජයේ ජීවිතය තුළ ආර්ථිකයට වඩා මිනිස් ජීවිතයේ අපේක්ෂා හා සිතුම් පැතුම් ප්‍රධාන වේ. එම පැරණි සමාජයේ විශේෂ ලක්ෂණයක් වශයෙන් කෘෂිකාර්මික සමාජය ප්‍රධාන වීම නිරීක්ෂණය කළ හැකි ය. එම පුරාතන සමාජයේ මිනිසුන් අතර බැඳීම්, ආර්ථික බැඳීම්වලට වඩා වැදගත් වේ. ආර්ථිකය මිනිසුන්ගේ ජීවිතවලට ප්‍රධාන බලපෑමක් නොකරයි. සොබාදහම හා සමීප ව කටයුතු කිරීම විශේෂ ලක්ෂණයකි. මිනිසාගේ අවශ්‍යතාවලට ගැළපෙන ප්‍රමාණයට පමණක් ආර්ථික සම්පත් අවශ්‍ය කරයි.

පුද්ගල චරිත වශයෙන් ගත් කල් හී ගම්පෙරළිය චිත්‍රපටයේ පියල්ගේ අරමුණුවල ස්වරූපය මගින් මිනිසා නූතන සමාජයේ ඉහළට නැගීමේ ආශාවත් මුදල, ධනය, බලය, කුලය, ගෞරවය අපේක්ෂා කරගෙන කටයුතු කිරීමත් නිරීක්ෂණය වේ. පියල් පරාජිත පෙම්වතෙකි. ඔහුට අහිමි වන පෙම්වතිය ලබා ගැනීමේ ලා ඇයගේ විවාහයෙන් පසුවත් ඈ කෙරෙහි ම අපේක්ෂා සහගත වේ. නන්දා කෙරෙහි ඇති ආදරයට වඩා ඊට

හේතු වන්නේ පියල්ට කුලය පිළිබඳ ඇතිවන හීනමානය යි. වලව් පෙළපත හා සෘජු සම්බන්ධයක් ඇති කරගත හැකි වන්නේ නන්දා හා විවාහ වීමෙනි. පියල්ගේ ආගමික හා සමාජීය ජීවිතය පෞද්ගලික අරමුණුවලට සීමා වේ. පියල් භෞතික පරිසරය, නිවෙස, වාහන ආදිය කෙරෙහි විශේෂ අවධානයෙන් ගොඩනගයි. මෙම අරමුණු අනුරාධපුර යුගයේ ගැමුණුගේ අරමුණුවල ස්වරූපය හා තුලනය කිරීමේ දී විශේෂතා රාශියක් ප්‍රකට කරයි. චිත්‍රපටයේ ගැමුණු කුමාරයා ද පරාජිත පෙම්වතෙකි. ඔහු ආදරය කළ තරුණිය විවාහ කර ගැනීමට හැකියාවක් තිබුණ ද ප්‍රතිපත්තිමය ජීවිතය ප්‍රධාන කොට ගන්නා බැවින් එම විවාහය ප්‍රතික්ෂේප කරයි. ගැමුණුට පෙම්වතියගෙන් එල්ල වන චෝදනාව වන්නේ "නියම පිරිමිකම යනු තමන්ට අයිති නැති දෙයක් වුණත් බලෙන් හරි ගන්න එක" යන්න ය. එහෙත් ගැමුණු පවසනුයේ "මා හිතා උන්නේ ඒකේ අනිත් පැත්ත" යන්න ය. තම පෙම්වතිය විසින් වෙනත් තරුණයෙකුට තමන්ට පූර්වයෙන් වචනයක් ලබා දී තිබීම කඩ නොකරන්නට ගැමුණු උත්සාහ කරයි. මේ අනුව වගකීම් සහගත මානව හැසිරීමක් අනුරාධපුර යුගයේ විසූ තරුණ මානවයා වෙතින් මතුකර පෙන්වීමට චන්ද්‍රසිරි උත්සාහ කරයි. එසේ ම ගැමුණු සමාජයේ ඉහළ නැගීමේ ආශාවක් නැත්තෙකි. මුදල ධනය බලය කුල ගෞරවය අපේක්ෂා නොකර අතහරින්නෙකි. සිය පෞද්ගලික අරමුණුවලට වඩා සමාජයේ අරමුණු කෙරෙහි උනන්දු වූවෙකි. භෞතික පරිසරය ගොඩනැගීම කෙරෙහි උනන්දු නොවේ. ගැඹුරු ජීවන හා චින්තන ශක්තියක් ප්‍රකට කරයි. මේ අනුව මහරජ ගැමුණු හා ගම්පෙරළිය චිත්‍රපට ද්විත්වයෙන් පැහැදිලි වන එකී යුග දෙකෙහි මානව අරමුණුවල ස්වභාවයන් වෙනස් බව ප්‍රකාශ කිරීමයි. නූතන මානව ජීවිතය අගතීන් කෙරෙහි නම්‍ය වන බව ද පැහැදිලි වේ. එහෙත් පුරාතන මානවයා මානව ගෞරවය හා අනෙකා පිළිබඳ සංවේදී වීම ප්‍රධාන ලක්ෂණයක් වෙයි.

**නිගමනය**

මෙම පර්යේෂණය නූතන හා අනුරාධපුර යුගවල මානව අරමුණු පිළිබඳ සිනමා කෘති ද්විත්වයක් පදනම් කරගෙන අධ්‍යයනය කරන ලද අතර ඉන් පැහැදිලි වූ නිගමනය වූයේ සැබෑ මානව හිතවාදී දියුණුවක් ප්‍රකට වනුයේ අනුරාධපුර යුගයේ බවත් නූතන යුගයේ මානව හිතවාදී අරමුණු වෙනුවට ප්‍රධාන වනුයේ ඒ ඒ පුද්ගලයාට විශේෂ වූ පටු අරමුණු බවත් ය. පුද්ගලයා මත හා සමාජය මත හෙළන ආකල්ප හා දෘෂ්ටීන් අනුවත් අනුරාධපුර සමාජය උසස් සමාජ ලක්ෂණයන්ගෙන් යුක්ත බව පැහැදිලි විය. නූතන යුගයේ පුද්ගල සන්තුෂ්ටියට වඩා වැදගත් වන්නේ සමාජයට ව්‍යාජව පෙනී සිටීමේ ලක්ෂණය යි. ව්‍යාජය විසින් මිනිසා අත්පත් කරගැනීම නූතන යුගයේ ඛේදවාචකය යි. එහෙත් අනුරාධපුර යුගයේ මානව ගරුත්වය හා ප්‍රතිපත්ති මූලික ජීවිතය මානවයාට වැදගත් වී තිබේ.

**මුඛ්‍ය පදඃ** අනුරාධපුර යුගය, ගම්පෙරළිය, නූතනත්වය, පුද්ගලාර්ථවල බෞද්ධ මුහුණුවර, මහරජ ගැමුණු

**ආශ්‍රිත ග්‍රන්ථ**

*ගම්පෙරළිය,* (1963). (චිත්‍රපටය) ලෙස්ටර් ජේම්ස් පීරිස්. ශ්‍රී ලංකාව.

*මහරජ ගැමුණු,* (2015). (චිත්‍රපටය) ජයන්ත චන්ද්‍රසිරි. ශ්‍රී ලංකාව.

Badiou, A. (2012) *In Praise of Love. Translated by P. Bush*. London: Serpent's Tail

Bailyn, B. (1982) 'The challenge of modern historiography', The American Historical Review, 87(1), pp. 1–24. Available at: https://doi.org/10.2307/1863306

MacDougall, D. (1998) *Transcultural Cinema*. Edited by L. Taylor. Princeton, NJ: Princeton University Press.